# භූත කුණාටුව

විරවලා නම් එක් ගෝත්‍රික වෙදෙක් තම ගෝත්‍රයේ වැඩිහිටියකු 1974 දී උතුරු ඕස්ට්‍රේලියාව අසල දූපතක රහසිගතව හමුවී තමාගේ ඉඩමට පතල්කරුවන් කරන හානිය වැළැක්වීමට කුණාටුවක් කැඳවීම සඳහා පාරම්පරික පැරණි මන්ත්‍රයක් ජප කළේ ය.

ඕස්ට්‍රේලියාවට හැමූ දරුණුම කුණාටුව වූ ට්‍රැසි කුණාටුව ඊට දෙමසකට පසු නත්තල් දා උදේ හමා ඕස්ට්‍රේලියාවේ ඝර්ම කලාපික අගනුවර වන ඩාර්වින් නගරය සමතලා කළේ ය.

එය ගෝත්‍රික හූනියමක් ද ? නැත්නම් අහම්බෙන් එකට සිදු වූ සිදුවීම් දෙකක් ද ?

නගරයේ වෙරළබඩ විසූ ගෝත්‍රිකයෝ අනතුරු හැඟවීම්වලට කන්දී ඉන් කල්තියා ඉවත් වූහ. ඒ ගැන නොතැකූ මිනිස්සු 50 ක් මරුමුවට පත් වූහ.

සන්ද්‍රා ලී බෘන්හෝම්ස් (Virawala, Painter of the dreaming) නම් තම අලුත් ම පොතින් ට්‍රැසි කුණාටුවේ කතාව කියමින් ගෝත්‍රික සංස්කෘතිය හෙවත් ජීන දැකීම පැහැදිලි කරයි. ඇත්තටම එය පැරණි ආගමකි, ඇදහිල්ලකි. එය අවුරුදු 45,000 කට වඩා පැරණි ය.

ගෝත්‍රික කලා කෘති ශුද්ධ වූ පුස්ථකයක පිටු වැන්න. ක්‍රිස්තියානි බයිබලය හෝ මුස්ලිම් කෝරානය මෙන් පූජනීයය.

ගෝත්‍රික සංස්කෘතිය සටහන් කරමින්, සුරකිමින් 1950 සිට වගා නොවූ ගෝත්‍රික පෙදෙස්වල සැරිසැරූ සුදු ඕස්ට්‍රේලියානු ජාතික හෝම්ස් ගෝත්‍රික චාරිත්‍ර විධිවලට උපකාර වන මෙම සිතුවම් සක්‍රමේන්තු හෙවත් සිහින දැකීමේ විශේෂ ධර්මචාරිත්‍ර ප්‍රකාශන බව පවසයි.

පාරම්පරික ගෝත්‍රික ඓතිහාසික සිද්ධි සහ ආගම සුරැකීමට ගෝත්‍රික වැඩිහිටියෝ මෙම පාරම්පරික මෝස්තර ඇන්දහ.

ගෝත්‍රිකයෝ ඈත අවදියේ තමන්ගේ මහා මුතුන් මිත්තන් ලෙස සළකන අවතාර සහ භූතයන් පොළෝ තලය හරහා ගමන් කරමින් ඔවුන්ගෙන් පැවැතෙන්නන් සඳහා ගංගා, ගස් කොළන් සහ කඳු හෙල් සහ සතුන් මැව් බව විශ්වාස කරති. මේ සියල්ල ඔවුනට පූජනීය වස්තු ය.

දේදුනු උරග භූතයා පොළොවේ විශාල මිටියාවත් කපා උතුරු ඕස්ට්‍රේලියාවේ ගංගා තැනූ අතර, බැරමන්ඩි මත්ස්‍යයන් ගේ පහරින් එම ගංගා ඇද වූ බව ගෝත්‍රිකයන් ගේ විශ්වාසයයි.

අද පවතින මුළු ජීවන රටාවටම වගකිය යුත්තෝ මෙම භූතයෝ ය. ඔහු සියලු සෘතු සහ උපතේ සිට මරණය දක්වා ජීවිතය පාලනය කරති.

